<u>මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සඳහා නව පරිගණක යන්ත්‍ර හා මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.</u>

01. මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයට අවශ්‍ය නව පරිගණක යන්ත්‍ර (Desktop) 10ක්, ෆොටෝ කොපි යන්ත්‍ර 01ක්,වර්ණ මුද්‍රණ යන්ත්‍ර 01ක් හා සාමාන්‍ය මුද්‍රණ යන්ත්‍ර 01ක් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

- වැඩිදුර තොරතුරු සඳහා පහත සඳහන් කාර්යාලීය වෙබ් අඩවිය භාවිතා කරන්න.
- ඔබගේ මිල ගණන් **2026 නොවැම්බර් මස 20 වන දින ප.ව.02.00ට** පෙර ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ලිපිනය - සභාපති, ප්‍රාදේශීය සභාව,මාලිම්බඩ,පාලටුව,මාතර.
වෙබ් අඩවි ලිපිනය - www.malimbadaps.lk
දුරකථන අංකය - කාර්යාලය - 041-2240208(ලේකම් හෝ සැපයුම් නිළධාරී)
ෆැක්ස් අංකය - 041-2240093
ඊ මේල් ලිපිනය - malimbada.ps@gmail.com

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභා ප්‍රසම්පාදන කමිටුව
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
මාලිම්බඩ
පාලටුව
මාතර.

- **ඉහත පුවත්පත් දැන්වීමට අදාල තොරතුරු පහත සඳහන් පරිදි වේ.**

Procurement of Goods Bidding Document
Invitation of Quotations
For
Procurement of
Supplying Computers,Photo copy machine & Printers

Procurement Number- MPS 02/02/ SPMDP2026-05(Tec:Items)

MALIMBADA PRADESHIYA SABHA

Issued From

Chairman
Malimbada Pradeshiya sabha
Malimbada
Palatuwa
Matara.

Bidder Name:

Bidder Address

<u>මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සඳහා නව පරිගණක යන්ත්‍ර හා මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.</u>

1. මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයට අවශ්‍ය නව පරිගණක යන්ත්‍ර (Desktop) 10ක්, ෆොටෝ කොපි යන්ත්‍ර 01ක්,වර්ණ මුද්‍රණ යන්ත්‍ර 01ක් හා සාමාන්‍ය මුද්‍රණ යන්ත්‍ර 01ක් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

2. ඉහත ද්‍රව්‍ය සඳහා ඔබගේ මිල ගණන් **2026 නොවැම්බර් මස 20 වන දින ප.ව.02.00ට** පෙර **ලියාපදිංචි තැපෑල මගින් හෝ කාර්යාලයට ගෙනැවිත් බාරදීම මගින්** ඉදිරිපත් කල යුතුය.

ලිපිනය - සභාපති, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,මාලිම්බඩ,පාලටුව,මාතර.

<u>මිල ගණන් එවීමේදී පහත සඳහන් කොන්දේසි සලකා බලනු ලැබේ.</u>

I. ඔබගේ මිල ගණන් පිටපත් 02කින් ඉදිරිපත් කරන්න.
   - මිල ගණන් එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ **පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර සඳහා මිල ගණන් - පිටපත 01** **පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර සඳහා මිල ගණන් - පිටපත 02** ලෙස සඳහන් කරන්න.
   - ලංසුපත් ඉහත සඳහන් පිරිදි පිටපත් දෙකකින් වෙන වෙනම පිළියෙල කර, නැවත එම පිටපත් දෙක එක් කවරයක බහා එහිද වම්පස ඉහල කෙලවරේ **"පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර සඳහා මිල ගණන්"** යනුවෙන් සඳහන් කරන්න.

II. ඔබගේ ලංසුපත් 2026.11.20 දින ප.ව.02.00ට පෙර කාර්යාලයට ගෙනැවිත් ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් හෝ ලියාපදිංචි තැපෑල මගින් ඉදිරිපත් කල යුතුය.

I. මිල ගණන් එවීමේදී අප විසින් ඉදිරිපත් කර ඇති ලංසු අයදුම්පතක් භාවිතා කරන්න. මෙම ලංසු අයදුම්පත කාර්යාලීය **වෙබ් අඩවියෙන් හෝ කාර්යාලයට පැමිණ** ලබාගත හැකිය. ලංසු අයදුම්පත සඳහා රු.1500.00ක ආපසු නොගෙවන ලංසු ලේඛන ගාස්තුවක් ගෙවිය යුතුය.

II. ලංසුපත් 2026.11.20 වන දින සිට දින 49 ක් දක්වා වලංගු විය යුතුය.

III. ඉදිරිපත් කරනු ලබන ලංසු සඳහා රු.25000.00ක ආපසු ගෙවන ලංසු සුරක්ෂණයක් කාර්යාලයට මුදලින් ගෙවීම මගින් ඉදිරිපත් කල යුතු අතර රිසිට්පතේ නම ලංසුපතේ සඳහන් නම පරිදි විය යුතුය.

IV. පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර වල සන්නම් නාමයන් වෙන වෙනම සඳහන් කරන්න.

V. පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර සඳහා ලබාදෙන වට්ටම් පිළිබඳව වෙන වෙනම සඳහන් කරන්න.

VI. පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර සඳහා **වගකීම් කාලයන්** පැහැදිලිව සඳහන් කළ යුතුය.

VII. පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර සැපයීමෙන් පසු සේවා සැපයීම පිළිබඳව ලංසුපතෙහි සඳහන් කළ යුතුය.

VIII. ඇණවුම ඉදිරිපත් කර දින 14ක් ඇතුලත **පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර** සැපයීමට හැකියාව තිබිය යුතුය. (2026.12.04 දින වන විට)

IX. ද්‍රව්‍ය ණය පදනම මත සැපයිය යුතුය.(ණය කාල සීමාව මාස 01) ඔබගේ ණය කාල සීමාව වෙනස් වන්නේ නම් එම ණය කාල සීමාව පැහැදිලිව සඳහන් කරන්න.

X. තවද සැපයම්කරුවන් ලියාපදිංචි කිරීමේදී ඉදිරිපත් කල කොන්දේසි පිළිබඳව අවධානය යොමු කරන්න.

XI. **අදාළ උපකරණ සම්බන්ධයෙන් මෙහි සඳහන් කරුණු වලට අමතරව සඳහන් කළ යුතු විශේෂ කරුණු වේ නම් ඒ පිළිබඳව වෙනම පැහැදිලිව සඳහන් කරන්න.**

XII. මිලදී ගනු ලබන භාණ්ඩ නොමිලේ ප්‍රවාහනය කර දිය යුතුය. **ප්‍රවාහන ගාස්තු අය කරන්නේ නම් ඒ පිළිබඳව මිල ගණන්හි පැහැදිලිව සඳහන් කරන්න.**

XIII. **ප්‍රසම්පාදන කමිටු තීරණය අවසන් තීරණය බවද වැඩිදුරටත් දන්වා සිටිමි.**

❖ වැඩිදුර තොරතුරු සඳහා මෙම දුරකථන අංකය භාවිතා කරන්න.

දුරකථන අංකය :- 041-2240208 (ලේකම් හෝ සැපයුම් නිළධාරී)

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභා ප්‍රසම්පාදන කමිටුව
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
මාලිම්බඩ
පාලටුව
මාතර

වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් තොරතුරු භාවිතා කරන්න.

❖ වෙබ් ලිපිනය - www.malimbadaps.lk
❖ ෆේස්බුක් පිටුව - Malimbada pradeshiya sabawa
❖ ඊ මේල් ලිපිනය - malimbada.ps@gmail.com
❖ කාර්යාලීය දුරකථන අංකය - 041-2240208
❖ ෆැක්ස් අංකය - 041-2240093